**ජාතික පර්යේෂණ සභාව - 2014**

**------------------------------------**

ජාතික පර්යේෂණ සභාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2007 සැප්තැම්බර් 15 දිනැති අංක 1514/28 දරන අතිවිශේෂ ගැසට්පත්‍රයේ පළ කරන ලද නිවේදනය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම**

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 පර්යේෂණ සභාව ස්ථාපිත කිරීම**

**------------------------------------**

ජාතික පර්යේෂණ සභාව 2007 සැප්තැම්බර් 15 දින අංක 1514/28 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ජනාධිපති විශේෂ විධි විධාන යටතේ පිහිටුවා ඇති ආයතනයකි. එම විශේෂ විධානයේ දක්වා ඇති පරිදි ව්‍යවස්ථාවක් මගින් පර්යේෂණ සභාවක් පිහිටු වීමට අවශ්‍ය කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන වන විටද සම්පාදනය කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

## 1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

## 2.1 තත්ත්වාගණනය කළ මතය

----------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ජාතික පර්යේෂණ සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------------

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයෙන් ලැබෙන ප්‍රාග්ධන ප්‍රදානයන් හා එයට අදාල ගැලපීම් පිළිබිඹු වන පරිදි වෙනම ප්‍රදාන ගිණුමක් පවත්වාගෙන නොතිබූ අතර මේ සම්බන්ධව ගනුදෙනු සමුච්චිත අරමුදලට ගලපා තිබුණි.

(ආ) පූර්ව කාලපරිච්ඡේදයට අදාල වූ එකතුව රු.3,487,046 ක්වූ ගැලපීම් පූර්ව කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීම හා ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කිරීම සිදු නොකර, සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදලට ගලපා තිබුණි.

(ඇ) ප්‍රාග්ධන ප්‍රදානවලින් මිලදී ගත් කාර්යාල උපකරණ සඳහා පෙර වර්ෂයේ රු.609,578ක් වූ ක්ෂය වලට අදාලව ක්‍රමක්ෂය වෙනුවෙන් ගිණුම්වලට ගැලපීම් කර නොතිබුණි.

## 2.3 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

-------------------------------------------------------------------------------

පහත සඳහන් නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීතිරීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල්රෙගුලාසි 371(2) (ආ)(ඇ) | ගණන්දීමේ නිලධාරියෙකු විසින් තම යටත් නිලධාරියෙකුට එක් අවස්ථාවකදී නිකුත් කළ හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමය රු.20,000කට වැඩි නොවිය යුතු වුවද ඊට පටහැනිව අවස්ථා 27කදී එකතුව රු.1,724,300ක අතුරු අග්‍රිම ලබා දී තිබුණි |
| ආ) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත | පර්යේෂණ සභාවේ සේවය කරන කිසිදු සේවකයෙකු සඳහා සේවක පාරිතෝෂික වෙන් කිරීම් සිදුකර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය.<br>(i) 9.3.1 වගන්තිය | පුරප්පාඩු වී ඇති තනතුරු අවිනිශ්චිත කාලයක් දක්වා වැඩබලන තනතුරු මගින් සම්පූර්ණ කිරීම සිදු නොකළ යුතු අතර වැඩ බැලීමේ නිලධාරියෙකු පත්කළ යුත්තේ උපරිමය මාස 03ක කාලයක් දක්වා පමණි. එහෙත් ජාතික පර්යේෂණ සභාවේ ගණකාධිකාරී තනතුර සඳහා 2003 වර්ෂයේ සිට අවුරුදු 11කට අධික කාලයක් සඳහා වැඩබැලීමේ පත්වීම් සිදුකර දීමනා ගෙවා තිබුණි. |
| | (ii) 9.3.1 (vi) (vii) වගන්ති | පර්යේෂණ සභාව පිහිටුවා අවුරුදු 06කට අධික කාලයක් ගත වී ඇතත් විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | 2006 ජනවාරි 25 දින ජාතික ප්‍රසම්පාදන වක්‍රලේඛ සංග්‍රහයේ 8.9.1(අ) වගන්තිය | පර්යේෂණ ව්‍යාපෘති 5ක් සඳහා රු.30,999,100ක උපකරණ මිලදී ගෙන තිබූ නමුත් විධිමත් ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. |
| (ඉ) | 2012 පෙබරවාරි 23 දිනැති ප්‍රසම්පාදන අත්පොත් සඳහා වූ අතිරේක 21හි 2.14.1 වගන්තිය | වටිනාකම රු.2,000,000ට වඩා වැඩි මිලදී ගැනීම් සඳහා විවෘත ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කළ යුතු වුවද 2012 හා 2013 වර්ෂවල දී එකතුව රු.27,549,100ක් වටිනා උපකරණ 04ක් මිලදී ගැනීමේදී මිල සැදැහුම් ක්‍රමය අනුගමනය කර තිබුණි. |

### 2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී අත්හැර දමන ලද ව්‍යාපෘති වලින් ඉතිරි වූ එකතුව රු.82,287,388ක් නැවත භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමට කටයුතු නොකර නව පර්යේෂණ ව්‍යාපෘති සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව භාවිතා කර තිබුණි.

(ආ) විධිමත් අනුමැතියකින් තොරව පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා රු.6,550,000ක් වටිනා Gas Chroma to Graph උපකරණය මිලදී ගෙන තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පර්යේෂණ සභාවේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.1,038,702 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,357,760ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,396,462ක වර්ධනයක් දක්නට ලැබුණි. පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී පුනරාවර්තන ප්‍රදාන ලැබීම් සියයට 50කින් පමණ වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3.2 විග්‍රහාත්මක සමාලෝචනය**

---------------------------

ජංගම වත්කම් වලින් සියයට 98 ක් නියෝජනය කරනුයේ පර්යේෂණ ප්‍රදාන වෙනුවෙන් බැංකු ජංගම ගිණුම් වල තැන්පත් කර ඇති මුදල් වන අතර මෙම තත්ත්වය වර්ෂය පුරා පැවතී තිබීමෙන් ඵලදායී පරිදි අරමුදල් කළමනාකරණය කෙරෙහි අවධානය යොමුකර නොමැති බව නිරීක්ෂණය විය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

-------------------------

**4.1 කාර්යසාධනය**

--------------

**4.1.1 භෞතික කාර්යසාධනය**

----------------------------

(අ) 2006 – 2013 දක්වා කාලපරිච්ඡේදය තුළ පර්යේෂණ සභාව පර්යේෂණ 276ක් සඳහා රු.1,155,000,000ක මුදලක් ප්‍රදානය කර තිබුණි. ඉන් පර්යේෂණ 22ක් අත්හැර දමා තිබුණු අතර පර්යේෂණ 40ක් නියමිත කාලය තුළ නිම කිරීමට නොහැකි වී තිබුණි. එසේම පර්යේෂණ 07ක අවසන් පර්යේෂණ වාර්තා විගණිත දිනය දක්වා ඇගැයීම් කටයුතු අවසන් කර නොතිබුණි.

(ආ) පර්යේෂණ ව්‍යාපෘති නිම වී අවසන් වාර්තා ඉදිරිපත් කළ පර්යේෂණ 37ක් 2013 හා 2014 වර්ෂ වලදී ඇගයීමට ලක්කර තිබුණද ඉන් විද්‍යා නාමකරණ දර්ශකයේ (Science Citation Index) පර්යේෂණ ප්‍රදාන 07ක් සඳහා පමණක් ප්‍රකාශන සිදුකර තිබුණි. එකතුව රු.37,052,360 ක පර්යේෂණ ප්‍රදාන ලබාදුන් පර්යේෂණ 11කට අදාලව විදේශීය හෝ දේශීය ප්‍රකාශන කිසිවක් සිදුකර නොතිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ඇ) භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබාගෙන සිදුකරනු ලබන පර්යේෂණ අවසන් වූ පසු පර්යේෂණ ප්‍රතිඵලය වැඩි දියුණු කිරීම, භාවිතා කිරීම හා ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා තාක්ෂණ පැවරීම (Technology Transfer) සිදුකළ යුතු වුවත් එකතුව රු. 69,036,946ක ප්‍රදාන ලබාගත් පර්යේෂණ ප්‍රදාන 23ක පර්යේෂණ ප්‍රතිඵල සමාලෝචිත වර්ෂය අවසාන වන විටද භාවිතා කිරීම හෝ පැවරීම සිදුකර නොතිබුණි.

(ඈ) රජය වෙනුවෙන් පර්යේෂණ ක්‍රියාත්මක කිරීම සඳහා භාණ්ඩාගාර අරමුදල් ලබාදෙන නියෝජිතයා ලෙස ක්‍රියාකරන ජාතික පර්යේෂණ සභාව විසින් නිමකළ පර්යේෂණ 76කට අදාලව කිසිදු පසු විපරමක් සිදුකර නොතිබුණි.

(ඉ) එකතුව රු. 23,627,572ක භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබාදුන් පර්යේෂණ ව්‍යාපෘති 07කට අදාල පර්යේෂණ වාර්තා ඇගැයීමෙන් පසුව එම ව්‍යාපෘති අසාර්ථක/ අසතුටුදායක ව්‍යාපෘති ලෙස දක්වා තිබුණි.

(ඊ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂයේදී "අරමුණුගත බහු විෂයයික පර්යේෂණ ව්‍යාපෘති ප්‍රදාන වැඩසටහන " සඳහා රු.100,000,000ක ප්‍රදාන ලබා දීමට සැලසුම් කළද සමාලෝචිත වර්ෂයේ දී පර්යේෂණ ව්‍යාපෘති 05ක් වෙනුවෙන් රු.234,120,000ක් ලබාදී තිබුණ අතර "පෞද්ගලික රාජ්‍ය හවුල්කාරිත්ව වැඩසටහන" සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු.50,000,000ක් වැය කිරීමට සැලසුම් කළද එක් ව්‍යාපෘතියක් සඳහා පමණක් රු.10,109,000ක් වැය කර තිබුණි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-------------------------------------

සමාලෝචිත වර්ෂයේදී රු.50,307,876ක් වූ භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින් මිලදී ගත් වත්කම් හා උපකරණ අදාළ ව්‍යාපෘති අවසන් වීමෙන් පසුව පර්යේෂණය සිදුකළ ආයතනයට විධිමත් පරිදි පවරා නොතිබුණි.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) ජාතික පර්යේෂණ සභාව මගින් තෝරාගනු ලැබූ පර්යේෂණ ව්‍යාපෘති සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා දීමේ දී, පර්යේෂණ ආරම්භ කරන අවස්ථාවේදීම අවුරුදු 03 ක කාලපරිච්ඡේදයකට අදාළ සම්පූර්ණ ප්‍රතිපාදන මුදලම ඒ ඒ ව්‍යාපෘතිය යටතේ ජංගම ගිණුම්වලට බැර කර තිබූ නමුත් පසුගිය වර්ෂ කිහිපයක බැංකු ජංගම ගිණුම් ශේෂයන් පරීක්ෂා කිරීමේදී එම ගිණුම්වල පහත සඳහන් පරිදි අඛණ්ඩව අධික මුදලක් නිෂ්ක්‍රීයව තිබූ බව නිරීක්ෂණය විය.

| වර්ෂය | ජංගම ගිණුම් වලට බැරකළ ප්‍රතිපාදන මුදල | බැංකු ජංගම ගිණුම් වල වර්ෂය අවසානයේ ඉතිරි මුදල |
|---|---|---|
| | රු. | රු. |
| 2011 | 200,000,000 | 268,113,399 |
| 2012 | 220,000,000 | 346,873,287 |
| 2013 | 217,000,000 | 396,340,514 |
| 2014 | 236,034,583 | 454,696,778 |

(ආ) ව්‍යාපෘති කාලය අවුරුදු 2 – 3 ක කාල පරාසයක් වන ව්‍යාපෘති 5ක් සඳහා එකතුව රු.30,999,100ක් වූ උපකරණ මිලදී ගැනීම සඳහාම මාස 3 සිට මාස 11 දක්වා කාල පරාසයක් ගතවී තිබුණි.

**4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ 03ක් වූ ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළදී ව්‍යාපෘතියට අවශ්‍ය උපකරණ හා රසායන ද්‍රව්‍ය කඩිනමින් මිලදී ගෙන පර්යේෂණ කටයුතු අදාළ කාලපරිච්ඡේදය තුළදී නිමකල යුතු ව්‍යාපෘති 6ක කාලසීමාව අවසන් වී ව්‍යාපෘතියට අදාල බැංකු ජංගම ගිණුම් ද වසා දැමීමෙන් පසුව රසායන ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් එකතුව රු.1,196,070ක් පර්යේෂණ සභා බැංකු ගිණුමෙන් ගෙවීම් කර තිබුණි.

(ආ) ව්‍යාපෘති ගිවිසුමේ 06 පරිච්ඡේදය අනුව අවසන් වූ ව්‍යාපෘති සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින් මිලදී ගෙන තිබූ ස්ථාවර වත්කම්/ උපකරණ නැවත ජාතික පර්යේෂණ සභාව වෙත පවරා ගැනීම හෝ අදාළ පර්යේෂණ ආයතනයට පැවරීම හෝ වෙනත් පර්යේෂණ ව්‍යාපෘතියකට මාරු කිරීම කළ යුතු වුවද 2009 සිට 2011 දක්වා කාලච්ඡේදය තුළ අවසන් වූ ව්‍යාපෘති 04කට අදාළව රු.8,028,334ක් වූ වත්කම් හා උපකරණ පවරාදී තිබුණේ දීර්ඝ කාලයක් ගතවීමෙන් පසු 2015 අප්‍රේල් මාසය තුළදී වන අතර ව්‍යාපෘති 4 ක් සඳහා මිලදීගත් රු.8,361,080 ක් වූ වත්කම් හා උපකරණ එසේ පවරා ගෙන නොතිබුණි. මේ අනුව මෙම වත්කම් ප්‍රයෝජනවත් පරිදි උපයෝජනය කිරීමට නොහැකිව තිබුණි.

(ඇ) පර්යේෂණ සභාව විසින් විවිධ කාර්යයන් සඳහා අත්තිකාරම් ලබා දීමේ දී අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා අවස්ථා 19කදී එකතුව රු.1,328,600ක් අත්තිකාරම් ලබා දී තිබූ අතර ඉන් ඉතිරි වූ මුදල සියයට 13.5 සිට සියයට 68.9 දක්වා වූ පරාසයක විය.

**4.5 අරමුදල් ඌන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම හා ප්‍රතිපාදන සම්පූර්ණ ලෙස උපයෝජනය නොකිරීම නිසා පර්යේෂණ සභාව විසින් පර්යේෂණ ව්‍යාපෘති සඳහා ජංගම ගිණුම් වලට බැර කරනු ලබන මුදල් ඉතිරි වී තිබූ බව ව්‍යාපෘති බැංකු ජංගම ගිණුම් පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. ඒ අනුව රු. 52,523,721 ක මුදල් ප්‍රමාණයක් 2010 සිට 2014 දක්වා අවුරුදු 04 කට අධික කාලපරිච්ඡේදයක් තුළ නිෂ්ක්‍රීයව බැංකු ජංගම ගිණුම්වල අක්‍රීයව තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) ව්‍යාපෘති ගිවිසුමේ I පරිච්ඡේදයේ ඇමුණුම II සහ පර්යේෂණ ව්‍යාපෘති සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව පර්යේෂණ ව්‍යාපෘති සඳහා අවශ්‍ය සියලුම වත්කම් හා උපකරණ ප්‍රතිපාදන නිදහස් කිරීමෙන් මාස 06ක් ඇතුළත මිලදී ගත යුතු වුවද, පර්යේෂණ ව්‍යාපෘති 16ක් සඳහා වත්කම් අත්පත් කර ගැනීම වෙනුවෙන් ලබාදී තිබූ රු.32,110,583ක ප්‍රතිපාදන වසර 1 සිට 4 දක්වා කාලයක් ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඇ) 2013 ඔක්තෝබර් මාසයේදී ව්‍යාපෘතියක් වෙනුවෙන් රු.3,336,500ක ප්‍රතිපාදන ලබාදී තිබූ අතර එම ප්‍රතිපාදන වලින් පර්යේෂණ සඳහා රසායන ද්‍රව්‍ය මිලට ගැනීම වෙනුවෙන් ගිවිසුම් වලට එළඹ තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද රසායන ද්‍රව්‍ය මිලට නොගැනීම නිසා භාණ්ඩාගාර ප්‍රතිපාදන ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව තිබුණි.

(ඈ) 2013 ඔක්තෝබර් මාසයේ ව්‍යාපෘතියක් සඳහා රු.6,162,870ක මුදලක් ලබාදී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ප්‍රතිපාදන ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව තිබුණි.

**4.6 අත්හැර දමන ලද ව්‍යාපෘති**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) <u>Isolation and Characterization of Nitrogen Fixing Bacteria Associated with rice.</u>**

i. පර්යේෂණ ව්‍යාපෘතිය 2010 ඔක්තෝබර් මස ආරම්භ වී 2013 ඔක්තෝබර් අවසන් වීමට නියමිතව තිබුණි. ව්‍යාපෘතිය සඳහා 2010 ඔක්තෝබර් මස රු.3,684,500ක ප්‍රතිපාදන බැංකු ජංගම ගිණුමකට බැරකර තිබුණ ද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

ii. ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම නිසා ව්‍යාපෘතිය සඳහා 2011 හා 2012 වර්ෂ වලදී මිලදීගත් රු.2,743,309ක වත්කම් අවුරුදු 04කට අධික කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි.

iii. එකතුව රු.490,454ක මුදලක් ව්‍යාපෘති ජංගම ගිණුම් වල නිෂ්ක්‍රීයව තිබී 2014 අප්‍රේල් 28 දින පර්යේෂණ සභාවට ලබාගෙන තිබුණු අතර ව්‍යාපෘතිය වෙනුවෙන් දැරූ රු.450,737ක මුදල ආර්ථික නොවන ගණුදෙනු ලෙස විගණනයේදී නිරීක්ෂණය විය.

**(ආ) <u>Screening and treatment of garment factory.</u>**

මෙම පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා රු.2,935,000ක මුදලක් 2012 දෙසැම්බර් 21 දින ජංගම ගිණුමකට බැරකර තිබුණි. පර්යේෂණ කටයුතු කිසිවක් සිදුකර නොතිබූ අතර 2014 දෙසැම්බර් 31 දින ව්‍යාපෘති කාලය අවසන් වීමට නියමිතව තිබුණි. අරමුදල් අවුරුදු 02ක කාලපරිච්ඡේදයක් තුල ජංගම ගිණුම් වල නිෂ්ක්‍රීයව තිබී 2014 දෙසැම්බර් 31 දින රු.2,919,250ක මුදලක් නැවත ජාතික පර්යේෂණ සභාවට ලබාගෙන තිබුණි.

**(ඇ) <u>Space – Time Dynamics and Parameters of growth of toxic.</u>**

මෙම ව්‍යාපෘතිය 2011 අගෝස්තු මස ආරම්භ වී 2014 අප්‍රේල් මස අවසන් වීමට නියමිතව තිබුණි. 2011 අගෝස්තු මස ව්‍යාපෘති අරමුදල් ලෙස රු.4,825,000ක් බැංකු ගතකර තිබුණි. ව්‍යාපෘති අරමුණ ඉටු වී නොතිබුණු අතර ව්‍යාපෘති ප්‍රතිපාදන රු.2,846,372ක් බැංකු ගිණුම් වල අවුරුදු 03ක කාලපරිච්ඡේදයක් පුරා නිෂ්ක්‍රීයව තිබී නැවත ජාතික පර්යේෂණ සභාවට ලබාගෙන තිබුණි.

(ඇ) **Spatial modeling of elephant movement for dentification of elephant corridors.**

ඉහත ව්‍යාපෘතිය 2012 අගෝස්තු 31 ආරම්භ වී 2014 අගෝස්තු 31 අවසන් වීමට නියමිතව තිබූ අතර ව්‍යාපෘතිය සඳහා රු.1,665,000ක් බැංකු ගතකර තිබුණි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබූ අතර ව්‍යාපෘති අරමුදල් අවුරුදු 02ක් නිෂ්ක්‍රීයව තිබී 2014 දෙසැම්බර් 31 දින ව්‍යාපෘති ගිණුම් වසා රු.1,424,320ක මුදලක් නැවත ජාතික පර්යේෂණ සභාවට ලබාගෙන තිබුණි.

(ඉ) **Comparative Analysis of Disinfection by Products Formation Mechanism with other water Quality Parameters.**

i. ඉහත ව්‍යාපෘතිය 2013 අප්‍රේල් මස ආරම්භ වී 2015 අප්‍රේල් මස අවසන් වීමට නියමිතව තිබුණි. ව්‍යාපෘතිය ආරම්භක දින රු.8,940,000ක මුදලක් බැංකු ජංගම ගිණුමකට බැරකර තිබුණි. ව්‍යාපෘතිය සඳහා රු.6,008,717ක් වටිනා වත්කම් මිලදී ගැනීමට ගිවිසුම් වලට එළඹ තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටද කිසිදු වත්කමක් මිලදී ගෙන නොතිබුණි.

ii. ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවන නිසා රු.2,031,840ක ප්‍රතිපාදන 2014 පෙබරවාරි 28 දින නැවත ජාතික පර්යේෂණ සභාවට ලබාගෙන තිබුණි.

(ඊ) **Evaluation of the clinical features and Identification**.

ඉහත ව්‍යාපෘතිය 2010 ඔක්තෝබර් 29 දින ආරම්භ වී 2013 ඔක්තෝබර් 29 දින අවසන් වීමට නියමිතව තිබුණි. 2010 ඔක්තෝබර් මස ව්‍යාපෘති ප්‍රතිපාදන ලෙස රු.3,352,384ක මුදලක් බැංකුගත කර තිබුණි. ව්‍යාපෘතියේ ප්‍රගතියක් නිරීක්ෂණය නොවූ අතර 2013 දෙසැම්බර් 31 දින වන විට රු.2,482,803ක් අවුරුදු 03ක කාලයක් බැංකු ගිණුම් වල නිෂ්ක්‍රීයව තිබී නැවත ජාතික පර්යේෂණ සභාවට ලබාගෙන තිබුණි.

(උ) ව්‍යාපෘති ගිවිසුමේ 8(1) හා (11) ඡේදය අනුව අත්හැර දැමූ හා නිම නොකළ ව්‍යාපෘති සම්බන්ධව බැංකු ජංගම ගිණුම් කඩිනමින් වසා දැමිය යුතු අතර එම ගිණුම්වල ඉතිරි මුදල් කඩිනමින් ආපසු ලබා ගැනීමට කටයුතු කළ යුතු ලෙස දක්වා තිබුණද, රු.15,794,759ක පර්යේෂණ ප්‍රදාන ලබාගත් පර්යේෂකයන් 04 දෙනෙකු ව්‍යාපෘති අතරමඟ නතර කර දමා තිබුණ ද එම බැංකු ජංගම ගිණුම් කඩිනමින් වසාදමා ඉතිරි මුදල් ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) **PPP 12 – 34 කිරි කල්තබා ගැනීමේ පර්යේෂණ ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතියේ යෝජිත මුළු පිරිවැය රු.65,392,016ක් වූ අතර මෙයින් රු.32,696,008ක මුදලක් පර්යේෂණ සභාව විසින් යෙදවීමට ගිවිසුම් වලට එළඹ 2013 මැයි 15 දින සභාව විසින් සම්පූර්ණ මුදලම ලංකා බැංකුවේ තැන්පත් කර තිබුණි. පෞද්ගලික අංශය විසින් රු.200,000ක මුදලක් බැංකුගත කර තිබුණි. දෙපාර්ශවය අතර වූ නොඑකඟතාවන් හේතුවෙන් ව්‍යාපෘතිය අතර මග නතර වී තිබූ අතර, 2014 නොවැම්බර් මස 17 දින දක්වා රු.32,696,008ක මුදලක් කිසිදු ප්‍රතිලාභයක් රහිතව ජංගම ගිණුමේ තැන්පත් කර තිබුණි.

**4.7 ප්‍රමාද වූ ව්‍යාපෘති**

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාර ප්‍රතිපාදන රු.19,203,130 ක් වෙන්කර තිබූ 2013 වර්ෂය තුළදී අවසන් කළ යුතුව පැවති පර්යේෂණ ව්‍යාපෘති 04ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටද නිම කර නොතිබුණි.

(ආ) පර්යේෂණ ක්ෂේත්‍රය සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය ලබා ගැනීමේ අරමුණින් පෞද්ගලික - රාජ්‍ය හවුල්කාරිත්ව වැඩසටහන යටතේ 2013 වර්ෂයේ දී ව්‍යාපෘති 03ක් ද, 2014 වර්ෂයේ දී එක් ව්‍යාපෘතියක් ද ආරම්භ කර තිබුණි. ව්‍යාපෘති සඳහා දැරිය යුතු පිරිවැය

පර්යේෂණ සභාව හා අදාල පෞද්ගලික සමාගම් සමාන අනුපාතයකට දායක වීමට එකඟ වෙමින් අවුරුදු 03ක කාල පරිච්ඡේදයක් සඳහා ව්‍යාපෘති ආරම්භ කර තිබුණි. ව්‍යාපෘති ගිවිසුම් ප්‍රකාරව 2014 දෙසැම්බර් 31 දිනට අදාළ එකතුව රු. 18,814,000 ක් පෞද්ගලික සමාගම් 04 ක දායකය ලෙස බැංකු ගත කළ යුතු වුවද බැංකු ගතකර තිබුණේ රු. 4,607,046 ක් පමණි.

i. මෙම ව්‍යාපෘති 04 සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලෙස රු.23,211,000ක් බැංකු ජංගම ගිණුම්වල තැන්පත් කර තිබුණි. ජාතික පර්යේෂණ සභාව විසින් ව්‍යාපෘති වල ප්‍රගතිය සලකා බැලීමකින් තොරව ප්‍රතිපාදන මුදා හැරීම නිසා ව්‍යාපෘති ආරම්භ කර වසර 2ක් ගතවී තිබියදීත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.16,262,471ක මුදලක් ඵලදායී කටයුතුවල නොයොදා නිශ්ක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය.

ii. 2000 ජනවාරි 19 දිනැති අංක 380 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය අනුව කෙරීගෙන යන ව්‍යාපෘති වලින් උපයන ආදායමෙන් කළමනාකරණ හා සේවා ගාස්තු ගෙවිය යුතු වුවද පර්යේෂණ ව්‍යාපෘතියකින් ආදායම් උපයා නොතිබුණි. චක්‍රලේඛය පදනම් කරගෙන ව්‍යාපෘති 04 ක කළමනාකරණ ගාස්තු ලෙස රු.4,230,250ක් ගෙවීමට ගිවිසුම් වලට එළඹ තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුලදී පෞද්ගලික සමාගම් වල ව්‍යාපෘති බැංකු මඟින් රු.677,802ක මුදලක් ගෙවා තිබුණි.

iii. ව්‍යාපෘති ගිවිසුම්වල II පරිච්ඡේදය අනුව පර්යේෂණ හවුල්කරු විසින් මාස 06කට වරක් පර්යේෂණ ප්‍රගතිය පිළිබඳ ප්‍රගති වාර්තා ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට ප්‍රගති වාර්තා 03ක් ඉදිරිපත් කළ යුතු වුවත් වර්ෂය තුල දී ප්‍රගති වාර්තා 02ක් ලැබී තිබූ අතර ඇගැයීම් කටයුතු අවසන් කර තිබුණේ එක් වාර්තාවක පමණි.

**4.8 කාර්ය මණ්ඩල පරිපාලනය**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට විධායක හා විධායක නොවන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 5 ක් පැවති අතර ජාතික පර්යේෂණ සභාවේ ඉහළ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ හා විධායක තනතුර වූ ලේකම් තනතුර 1999 වර්ෂයේ සිට ද, ගණකාධිකාරී තනතුර 2003 වර්ෂයේ සිට ද පුරප්පාඩුව පැවතුණි.

(ආ) පර්යේෂණ සභාව සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ දී විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර අනුමත කරගෙන නොතිබූ අතර කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ දී පුවත්පත් දැන්වීම් මගින් අදාල පුරප්පාඩු ප්‍රසිද්ධ කර විනිවිද භාවයකින් යුක්තව බඳවා ගැනීම් කටයුතු සිදුකර නොතිබුණි.

(ඇ) පර්යේෂණ සභාවේ අනුමත කාර්ය මණ්ඩලය සඳහා 2006 වර්ෂයේ සිට කාර්ය පැවරුම් හා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් බඳවා ගෙන තිබූ අතර එම නිලධාරීන් ස්ථිර තත්ත්වයට පත් කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද කටයුතු කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

-------------------------------------

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

-------------------

පර්යේෂණ සභාවේ අරමුණ කරා ළඟාවීම සඳහා උපයෝගී කරගනු ලබන භාණ්ඩාගාර අරමුදල් තුළින් පර්යේෂණ සභාවේ මූල්‍ය හා භෞතික ඉලක්කයන් සපුරා ගනු ලබන ආකාරය පිළිබඳව ක්‍රියාකාරී සැලැස්මෙන් පෙන්නුම් කළ යුතු වුවත්, ක්‍රියාකාරී සැලැස්මෙහි භෞතික ඉලක්කයන් ඇතුළත් කර නොතිබුණි.

## 5.2 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පර්යේෂණ සභාව සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 06ක් පවත්වා තිබුණද අභ්‍යන්තර විගණන වාර්තා හෝ බාහිර විගණන වාර්තා පිළිබඳව සාකච්ඡා කර නොතිබුණි.

## 5.3 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර, වර්ෂය තුල එකතුව රු.82,052,869ක වත්කම් මිලදිගෙන තිබුණි.

## 5.4. අයවැය ලේඛනමය පාලනය

2014 දෙසැම්බර් 31 දිනට අයවැයගත වියදම් ඉක්මවා තථ්‍ය වියදම් සියයට 32 සිට සියයට 137 දක්වා විචලනය වී තිබූ හෙයින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයන් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාවේ සභාපති වෙත යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) පර්යේෂණ ප්‍රදාන ලබාදීම
(ආ) වත්කම් කළමනාකරණය
(ඇ) ව්‍යාපෘති කළමනාකරණය
(ඈ) ගිණුම්කරණය